**ශ්‍රී ලංකා මේස පන්දු සංගමය - 2023**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මතය ව්‍යාචනය

ශ්‍රී ලංකා මේස පන්දු සංගමයේ ("සංගමය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත්, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සහ 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 21(අ) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මම මතයක් ප්‍රකාශ නොකරමි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංගමයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දක්වා ඇති රු 54,787 ක මුදල් ශේෂයෙහි රු 47,021 ක ලැබිය යුතු ශේෂයක් වැරදි ලෙස ඇතුළත් කර තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 4,109,874 ක මුදල් සහ මුදල් සමාන දෑ ශේෂයෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී පැවති සත්‍ය ශේෂ පිළිබිඹු කෙරුණි. | අදාළ මුදල් අයකර ගන්නා ලෙස ලිඛිතව දැනුම් දීමක් සිදු කර ඇති අතර මේ වන විට සංගමය විසින් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| අයිතමය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ආදායම | 13,865,606 | ලදුපත් | 2022 වර්ෂයේ ගිණුම්වලට අදාළ කිසිදු ලියවිල්ලක් නව නිලධාරී මණ්ඩලය වෙත භාර නොදීම හේතුවෙන් එය විගණනය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. | ආදායම් සහ වියදම් සතුටුදායක ලෙස සහතික කර පිළිගැනීම සඳහා විගණනය වෙත ලේඛන ප්‍රමාණවත් ලෙස සැපයිය යුතුය. |
| වියදම් | 14,211,226 | ගෙවීම් වවුචර | | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු. 259,426 ක් වූ ලැබිය යුතු ශේෂ තුනක් වසර 05 ක කාලයක සිට අයකර ගැනීමෙන් තොරව ගිණුම්වල දක්වා තිබුණි. | 2024 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන තුල අවශ්‍ය ගැලපීම් සිදු කරනු ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) 2018 වර්ෂයේදී සංගමයේ සාමාජිකයන් දෙදෙනකු වෙත ලබාදුන් රු. 81,478ක මුදල් අත්තිකාරම් 2024 අගෝස්තු 31 දින වන විටත් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන තුල අවශ්‍ය ගැලපීම් සිදු කරනු ඇත. | අත්තිකාරම් පියවීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණය ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදිය වෙත යොමු කිරීම | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අංක 1990/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශය පත් කරන ලද 2016 ඔක්තෝබර් 27 දිනැති ජාතික ක්‍රීඩා සංගම් නියෝග. | | | |
| (ආ) III වගන්තියේ අංක 7 (xi) රෙගුලාසිය. | වත්මන් ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම, කාල සීමාව තුළ අපේක්ෂිත ඉලක්කය සහ කාර්ය සාධන මට්ටම ඉහළ නැංවීමේ උපාය මාර්ග ඇතුළුව වසර දහයක කාලසීමාවක් සඳහා සංයුක්ත සැලැස්මක් පිලියෙල කර නොතිබුණි. | සංයුක්ත සැලැස්මක් සකස් කරමින් පවතී. | සංයුක්ත සැලැස්ම රෙගුලාසි වලට අනුකූලව සකස් කළ යුතුය. |
| (ආ) III වගන්තියේ අංක 7 (xii) රෙගුලාසි. | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර පවත්නා වර්ෂය අවසන් වීමට මාස තුනකට ප්‍රථම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ | පිළිගනී | රෙගුලාසි වලට අනුව ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ඇ) 2021 දෙසැම්බර් 17 දිනැති ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක DSD/NSA/ COM-01/202 හි 3 (III) ඡේදය. | සංගමය විසින් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව බැංකු ජංගම ගිණුම් 5ක් පවත්වාගෙන ගොස් තිබුණි. | 2024 වර්ෂයේ සිට බැංකු ගිණුම් දෙකක ශේෂයන් පමණක් ඉදිරිපත් කරනු ඇත. | මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 640,458 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 268,995 ක අතිරික්තයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 371,463 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෙර වසරට සාපේක්ෂව පරිපාලන වියදම් සැලකිය යුතු ලෙස අඩුවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන ලෙස බලපා තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතාව**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.42,370ක් සහ රු. 1,102,464ක් වූ මුදල් ශේෂයන් පිළිවෙළින් වසර 02ක් සහ වසර 04ක් පුරා බැංකු ජංගම ගිණුම් 4ක රැඳී පැවතුණි. මේ හේතුවෙන් රු. 307,453 ක පොලී ආදායමක් සංගමයට අහිමි වී තිබුණි | පිළිගනී. | නිෂ්කාර්යව පවතින මුදල් ශේෂය ඵලදායී ලෙස භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |